00413

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී ගෞරව උපාධි පාඨමාලාව - 3 මට්ටම

අවසාන පරීක්ෂණය - 2023/2024

LLU 3601 - ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය සහ නීති ඉතිහාසය

කාලය - පැය 03

---

දිනය - 2025 මැයි 27 වේලාව - ප.ව. 1.30 - ප.ව. 4.30

---

ප්‍රශ්න පත්‍රයේ සියලුම ප්‍රශ්න 08 කි.

ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු ලකුණු අඩු කෙරේ.

01. "ශ්‍රී ලංකාවට ඉංග්‍රීසි නීතිය අදාල කරගැනීම ව්‍යවස්ථාකරණයට පමණක් නොව, බ්‍රිතාන්‍ය යුගය තුල අධිකරණ ක්‍රියාකාරිත්වයටද බලපා තිබේ."

ඉහත ප්‍රකාශය ඇසුරින් ශ්‍රී ලංකාවට ඉංග්‍රීසි නීතිය හඳුන්වා දෙනලද විවිධ ක්‍රම පිළිබඳව සාකච්ඡා කරන්න.

ඔබගේ පිළිතුර අදාළ නිදසුන් හා නඩු තීරණ ඇසුරින් පහදන්න. (ලකුණු 20)

02. අජිත් කරලියද්ද හා මැණිකා කරලියද්ද ගැටඹේ ජීවත් වූ උඩරට මාපිය යුවළකගේ දරුවන්ය. අජිත්,ගවේශි සමග විවාහ වූ අතර එම විවාහයෙන් ඔවුනට දරුවන් තිදෙනෙකු ලැබුණි.ඔවුන් ගැටඹේ පිහිටි දෙමාපියන්ගේ මුල් නිවෘ වූ "කරලියද්ද වලව්වේ" ජීවත් වූහ. ගාල්ල පළාත් සභාවට අනුබද්ධ රජයේ සේවකයෙකු වූ මහේන්ද්‍ර සමග මැණිකා විවාහ වූවා ය. විවාහයෙන් වසර දෙකකට පසු ගාල්ලේ පැවති දේශපාලන රැලියකදී මහේන්ද්‍ර මෝටර් රථ අනතුරකින් ජීවිතක්ෂයට පත් විය.

මැණිකා වසර ගණනාවක් කිසිදු ආදායමක් නොමැතිව ගාල්ලේ හුදෙකලාව ජීවත් වූවා ය.ඇයගේ සොහොයුරාගේ ඉල්ලීම මත 2019 දී ඇය කරලියද්ද වලව්වට නැවත පැමිණියේ එහි ස්ථිරව පදිංචි වීමේ

අදහසිනි.පවුලේ දේපලින් හතරෙන් එකක් (1/4) ඇයට ලබා දීමට අජිත් කැමැත්ත ප්‍රකාශ කළ ද මැණිකාගේ නමින් ඒ සඳහා හිමිකම් ඔප්පුවක් ලබා දීමට අජිත් කිසිදු දිනෙක ක්‍රියා නොකළේ ය.

2020 නොවැම්බර් මස හදිසියේ ඇති වූ බරපතල ශ්වසන අපහසුතාවක් හේතුවෙන් අජිත් රෝහල් ගත කළ අතර දින කිහිපයකට පසුව කොරෝනා වෛරසය ආසාදනය වී ඔහු මිය ගියේය. පසුව ගවේශී මැණිකාට කරලියද්ද වලව්වෙන් පිටවන ලෙසට පැවසුවාය.තවදුරටත් ගවේශී තර්ක කර සිටියේ මැනිකා දීග විවාහයකට කරගත් බැවින් උඩරට නීතිය යටතේ උරුම අයිතිවාසිකම් කියාපෑමට ඇයට නොහැකි බවයි.

උඩරට නීතිය යටතේ ඇයගේ උරුම අයිතිවාසිකම් ඉල්ලා ගවේශීට විරුද්ධව නඩුවක් පැවරීමට මැණිකා අදහස් කරයි.

සාකච්ඡා කරන්න.

ඔබගේ පිලිතුරට අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන තීරණ හා නඩු තීන්දු ඇසුරෙන් පහදන්න.

**(ලකුණු 20)**

03. "රෝම ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ ශේෂ නීතිය වේ. නීතියේ මූලික මූලාශ්‍රය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන නොමැති විටදී, අධිකරණය මුලින්ම විමසා බලන්නේ විශේෂිත නීතියක් මගින් පාලනය වන්නේද යන්නයි. එසේ නොවී නම් ඔවුහු රෝම ලන්දේසි නීතිය යොදා ගනිති."

*LJM Cooray,Reception of Roman Dutch Law in Sri Lanka,(1974),at p.296*

ඉහත ප්‍රකාශය ඇසුරින්,ශ්‍රී ලංකාවේ රෝම ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ නීති මූලාශ්‍රයක් ලෙස අදාල වන ආකාරය පිළිබඳව සාකච්ඡා කරන්න.

ඔබගේ පිළිතුර අදාළ නඩු තීන්දු නීතිය සහ ව්‍යවස්ථාපිත විධිවිධාන ඇසුරෙන් පහදන්න.

**(ලකුණු 20)**

04. "නූතන සමාජ-දේශපාලනික සහ ආර්ථික සබඳතාවල ඇති සංකීර්ණතාවයන් ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීමේ දී බොහෝ අභියෝග නිර්මාණය කර ඇත"

*LLU3601 Legal System and Legal History of Sri Lanka, Block I, page-180*

ඉහත ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ සමකාලීන නීති පද්ධතියේ පහත සඳහන් අභියෝග සාකච්ඡා කරන්න.

අ) අධිකරණයේ ස්වාධීනත්වය

ආ) බහුවිධ නීති පද්ධතියේ ගැටළු

ඇ) නීතිය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයේ පවතින ප්‍රමාදය

ඔබේ පිළිතුර ප්‍රායෝගික උදාහරණ සමඟ පහදන්න. **(ලකුණු 20)**

05. 2024 දී සාහිල්,මුස්කියා සමග විවාහ විය. දැන් ඔවුහු මහනුවර වාසය කරති. ඔවුන්ට එම විවාහයෙන් දරුවන් නොමැති බැවින්, මඩකලපුව ප්‍රදේශයේ පදිංචි අවුරුදු තුනක් වයසැති ශම්මාස් දරුකමට හදා ගැනීමට ඔවුහු තීරණය කළහ.

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සාහිල් හා මුස්කියා ඔබගෙන් උපදෙස් ඉල්ලා සිටිති.

(අ) ශ්‍රී ලංකාවේ මුස්ලිම් නීතිය යටතේ ශම්මාස්ව දරුකමට හදා වඩා ගැනීමට ඔවුන්ට හැකියාවක් පවතින්නේද ? **(ලකුණු 05)**

(ආ) දරුකමට හදාගත් දෙමාපියන්ගේ දේපළවලට අන්තිම කැමති පත්‍ර රහිත අනුප්‍රාප්ති අයිතිවාසිකම් ඉල්ලා සිටීමට ශම්මාස්ට හැකියාවක් පවතින්නේ ද? **(ලකුණු 06)**

( ඇ) සාහිල් හා මුස්කියා මහනුවර පදිංචිව සිටිනා බැවින් ඔවුන් උඩරට නීතිය මගින් පාලනය වීමට හැකියාවක් ඇත්ද? **(ලකුණු 09)**

අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් ඔබගේ පිළිතුර පහදන්න.

06. චන්ද්‍රන් 1979 දී යාපනයේදී උපත ලැබූ අතර 1998 දී ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ කළමනාකරණ අධ්‍යයන පිළිබඳව උපාධි පාඨමාලාවකට තෝරා ගනු ලැබිණ. උපාධිය ලබාගත් පසුව ඔහු කොළඹ ප්‍රමුඛ පෙළේ බහුජාතික සමාගමක සේවයට බඳවා ගන්නා ලදී. ඔහු සමග වාසය කිරීමට ඔහුගේ දෙමාපියෝ ද කොළඹට පැමිණියහ.

2005 වසරේ දී ඔහුගේ මවුපියන් කොළඹදී රිය අනතුරකින් ජීවිතක්ෂයට පත්විය. අවමංගල චාරිත්‍ර සඳහා ඔවුන්ගේ දේහයන් යාපනයට රැගෙන යන ලදී. චන්ද්‍රන් බොහෝ අවස්ථාවන් වල ව්‍යාපාරික සහ පවුලේ කටයුතු සඳහා දෙමාපියන් ජීවත්ව සිටියදී යාපනයට ගොස් තිබුණි. ඔහු නිතරම යාපනයේ පිහිටි දෙමාපියන්ගේ නිවසේ කාලය ගත කළේය.

2012 දී චන්ද්‍රන් ජා-ඇළ පදිංචිව සිටි කතෝලික ගැහැණු ළමයෙකු වූ මේරි සමග විවාහ විය. ඔවුන්ගේ විවාහය යාපනයේ දී සිදු කරන ලදී. චන්ද්‍රන්ට යාපනයේ නිවසක් තිබුණද විවාහයෙන් පසුව තම බිරිඳ සමග ජා-ඇළ ජීවත්වීමට තීරණය කළ බැවින්, ඔහු එම ප්‍රදේශයෙන් නිවසක් මිලදී ගත්තේ ය.

2018 දී, චන්ද්‍රන් අවාසනාවන්ත ලෙස රිය අනතුරකින් මියයන විට අන්තිම කැමති පත්‍රයක් ලියා නොතිබුණි.

චන්ද්‍රන්ගේ සොහොයුරා වන මයුරන් කියා සිටින්නේ චන්ද්‍රන්ගේ දේපල තේසවලමේ නීතිය මගින් පාලනය වන බැවින් අන්තිම කැමති පත්‍ර රහිත උරුම අනුප්‍රාප්තිය යටතේ මේරිට එම දේපලවලට කිසිදු හිමිකම් පෑමක් කළ නොහැකි බවයි.

තේසවලමේ නීතිය යටතේ චන්ද්‍රන්ගේ නිවාස දේපලවලට කිසිදු හෝ අයිතිවාසිකමක් පවතින්නේද යන්න මේරි ඔබෙන් විමසා සිටියි.

මේරිට උපදෙස් දෙන්න.

ඔබගේ පිළිතුර අදාල නඩුතීරණ හා ව්‍යවස්ථාපිත විධිවිධාන මගින් පහදන්න. (ලකුණු 20)

00413

07. "යම් රටක නීති පද්ධතිය මගින් එම රටේ සමාජීය, සංස්කෘතික සහ ඓතිහාසික කරුණු නිරූපණය කරයි."

ඉහත ප්‍රකාශය ඇසුරෙන්, ශ්‍රී ලංකාවේ පවතින බහු නීති පද්ධතියේ වාසි හා අවාසි සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර ප්‍රායෝගික නිදසුන් මගින් පහදන්න. **(ලකුණු 20)**

08. පහත මාතෘකා අතරින් **ඕනෑම 02 ක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1. ලන්දේසීන් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් නීතිය හා උසාවි පද්ධතිය
2. *Campbell vs Hall (1774) 1 Cowp 204, 98 ER 1045*
3. බතාවියානු ව්‍යවස්ථා
4. පූර්ව යටත් විජිත සමයේ ලංකාවේ නීති පද්ධතිය **(10*2 = 20 ලකුණු)**

**** සියලුම හිමිකම් ඇවිරිණි ****